# නිවේදනය යි!

**1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් (Authorized Officers) සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් (Officers Authorized to Institute Proceedings & Conduct Prosecutions) වෙත:**

**සී./ස. බී.ඒ.එස්.එෆ්. (ලංකා) පුද්. සමාගම නමින් බැසමිඩ් කැට (ඩැසොමෙට් 98% ජී.ආර්.) සහ පින්කෙම් කාබොෆියුරාන් (කාබොෆියුරාන් 3% කැට) නිෂ්පාදන අනුකරණය කරමින් ව්‍යාජ නිෂ්පාදන බෙදා හැරීම හා අලෙවි කිරීම.**

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාර රට තුළ භාවිතා වන සියළුම පළිබෝධනාශක නිෂ්පාදන අනුමත ලේබලයකින් සහ ප්‍රමිතියෙන් යුක්තව ලියාපදිංචි වී තිබිය යුතුය. එහෙත්, සී./ස. බී.ඒ.එස්.එෆ්. (ලංකා) පුද්. සමාගම නමින් **බැසමිඩ් කැට (ඩැසොමෙට් 98% ජී.ආර්.)** සහ **පින්කෙම් කාබොෆියුරාන් (කාබොෆියුරාන් 3% කැට)** නිෂ්පාදනය අනුකරණය කරමින් එම නාමයන් යටතේ ම වංචනික ලෙස බෙදාහරින ලද සහ අලෙවි කරන ලද ව්‍යාජ නිෂ්පාදන සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත මූලික තොරතුරු අනාවරණය වී ඇත.

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ **බැසමිඩ් කැට (ඩැසොමෙට් 98% ජී.ආර්.)** සහ **පින්කෙම් කාබොෆියුරාන් (කාබොෆියුරාන් 3% කැට)** යන නම්වලින් සඳහන් කිසිදු ලියාපදිංචි නීත්‍යානුකූල නිෂ්පාදනයක් නොමැති අතර, උක්ත නිෂ්පාදන ලේබල සහ වර්ණ සංයෝජන සහ වෙළෙඳනාම ද ඇතුළුව මෙම නිෂ්පාදන කාලයක් පටන් භාවිතයේ පැවති නීත්‍යානුකූල නිෂ්පාදන අනුකරණය කරමින් ව්‍යාජ ලෙස ඇසුරුම් කර ඇති බව නිරීක්ෂණය වේ (ඇමුණුම 1-2).

ප්‍රධාන වශයෙන් තේ වගාව ව්‍යාප්තව ඇති නුවරඑළිය, ගම්පොළ, රුවන්වැල්ල, හැටන් සහ එළවළු වගා කරන කල්පිටිය වැනි ප්‍රදේශවලින් හමු වී ඇති මේ සමහ දැක්වෙන **බැසමිඩ් කැට (ඩැසොමෙට් 98% ජී.ආර්.)** සහ **පින්කෙම් කාබොෆියුරාන් (කාබොෆියුරාන් 3% කැට)** අනුකරණ ව්‍යාජ නිෂ්පාදන පිළිබඳව පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ සියළුම බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2020 නොවැම්බර් මස 06 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 Mobile 0772363824




**ඇමුණුම -1 සී./ස. බී.ඒ.එස්.එෆ්. (ලංකා) පුද්. සමාගම නමින් බැසමිඩ් කැට (ඩැසොමෙට් 98% ජී.ආර්.)** ව්‍යාජ අනුකරණ නිෂ්පාදනය




**ඇමුණුම 2- සී./ස. බී.ඒ.එස්.එෆ්. (ලංකා) පුද්. සමාගම නමින් ෆින්කෙම් කාබොෆියුරාන් (කාබොෆියුරාන් 3% කැට)** ව්‍යාජ අනුකරණ නිෂ්පාදනය